රජීවගේ මරණය පසුගිය දින ගණනාව පුරාම මාධ්‍ය ඔස්සේ පුළුල්ව ආවරණය වූ මාතෘකාවකි. මෙවන් සිදුවීමක් දිවි අහිමි කරගැනීමක් ලෙසින් ආවරණය කෙරෙන්නේ නම්, ඒ සමගින් හදිසි උපකාරක අංකද පළ කරන ලෙසින් මාධ්‍යවේදීන්ව දිරිමත් කෙරෙන්නේ, එම හදිසි උපකාරක අංක නිසාවෙන් තවත් ජීවිතයක් බේරාගැනීමට ලැබෙනා අවස්ථාව නිසායි. මෙම ලිපිය සමගින් හදිසි උපකාරක අංක සඳහන් වූයේ නම් වඩාත් යෝග්‍ය යැයි අපි පවසන්නේද ඒ හෙයිනි.

ඊට අමතරව මෙහිදී අපගේ නිරීක්ෂණයට ලක් වූ තවත් කරුණු දෙකක් තිබේ. එකක් නම්, "දෙමළ" සේවිකාවක යනුවෙන් මෙම ලිපියේ සඳහන් වීමයි. එහිදී අදාළ අයගේ වාර්ගිකත්වය සිදුවීමට අදාළ වන්නේ කෙසේද? එවැනි අදාළත්වයක් නොමැති නම්, වාර්ගිකත්වය සඳහන් කිරීම අනුචිත බව මාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වේ. එසේම මෙහි සඳහන් වන "මෙහෙකාරිය, වැඩකාරයන්" යන යෙදුම්ද, වර්තමානයට උචිත යැයි ඔබ සිතන්නේද? ඒ වෙනුවට වඩාත් උචිත වන්නේ ගෘහ සේවිකාව /සේවකයන් වැනි යෙදුමක් නොවන්නේද?

#MediaEthicsSL #SundayLankaadeepa #SinhalaPress